# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.08 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/406/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

## 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කුරුණෑගල පොලිස් ස්ථානය.

2026.03.07 දින රාත්‍රී කුරුණෑගල පොලිස් වසමේ තිත්තවැල්ල ඇලස්වත්ත ප්‍රදේශයේදී කුරුණෑගල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 126 මිලිග්‍රෑම් 500 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 35 ක් වන මාස්පොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කුරුණෑගල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2026.03.07 දින දහවල් පාදුක්ක පොලිස් වසමේ උඩුමුල්ල හන්දියේදී හෝමාගම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 14 මිලිග්‍රෑම් 420 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද බවට සැකකරන මුදල් රුපියල් 325,000/= ක් (තුන්ලක්ෂ විසිපන්දහසක්) සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පාදුක්ක පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 37 ක් වන පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පාදුක්ක පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දිය අනතුරකින් කාන්තාවක් බේරා ගැනීම - පොලිස් නාවික ජීවිතාරක්ෂක ඒකකය.

2026.03.07 වන දින උදෑසන කිතුල්ගල පොලිස් වසමේ ලියන්ඔයේ දියනෑමට ගිය කාන්තාවක් දියේ ගිලී අනතුරකට පත් අවස්ථාවේ ලියන්ඔය ආසන්නයේ රාජකාරී යෙදී සිටි පොලිස් නාවික ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් සැරයන් 26978 සුසන්ත, පොලිස් විශේෂ කාර්ය බලකායේ පොලිස් සැරයන් 66943 අධිකාරි සහ පොලිස් කොස්තාපල් 28244 බණ්ඩාර යන නිලධාරීන් විසින් එම කාන්තාව බේරාගෙන ඇත.

**අනතුරට පත්ව ඇත්තේ අවුරුදු 23 ක් වන බෙන්තොට ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

**04.** **යතුරුපැදියක මික්සර් රථයක් ගැටී යතුරුපැදිකරු ජීවිතක්ෂයට - වත්තල පොලිස් වසම.**

2026.03.07 දින රාත්‍රී වත්තල පොලිස් වසමේ කුඩගහපිටිය හන්දිය අසලදී අධිවේගී පිටවීමේ මාර්ගය දෙස සිට වත්තල මහබාගේ මාර්ගය දෙසට ධාවනය වූ යතුරුපැදික එම දෙසටම පිටුපසින් ධාවනය වූ මික්සර් රථයක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පැදිකරු රාගම රෝහලට ඇතුලත් කරන විට මියගොස් සිට ඇත.

**මරණකරු අවුරුදු 44 ක් වූ රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වත්තල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **යතුරුපැදියක් පදිකයෙකුගේ ගැටී පදිකයා ජීවිතක්ෂයට - එගොඩඋයන පොලිස් වසම.**

2026.03.07 දින රාත්‍රී එගොඩඋයන පොලිස් වසමේ පානදුර මොරටුව නව මාර්ගයේ ජය මාවත අසලදී පානදුර දෙසට ධාවනය වූ යතුරුපැදික මාර්ගය හරහා ගමන්කල පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා පානදුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 50 ක් වූ කොරළවැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එගොඩඋයන පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **පාපැදියක යතුරුපැදියක් ගැටී යතුරුපැදියේ පසුපැදිකරු ජීවිතක්ෂයට - පුලියන්කුලම පොලිස් වසම.**

2026.03.07 දින රාත්‍රී පුලියන්කුලම පොලිස් වසමේ පුලියන්කුලම වව්නියාව මාර්ගයේ රාමණූර් ප්‍රදේශයේදී වව්නියාව දෙසට ධාවනය වූ පාපැදියක එම දෙසටම ධාවනය වූ යතරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතරුපැදියේ පසුපැදිකරු මාර්ගයෙන් ඉවතට වීසිවී බරපතල තුවාල ලබා පුලියන්කුලම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 59 ක් වූ කටුපොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුලියන්කුලම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **බස් රථයක් යතුරුපැදියක ගැටී පැදිකරු ජීවිතක්ෂයට - නවගමුව පොලිස් වසම.**

2026.03.07 දින උදෑසන නවගමුව පොලිස් වසමේ හංවැල්ල කොළඹ මාර්ගයේ රණාල ප්‍රදේශයේදී කොළඹ දෙසට ධාවනය වූ බස් රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු නවගමුව රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 34 ක් වූ කෑගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ බස් රථ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර නවගමුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. ට්‍රැක්ටර් රථයකට යටවී එහි රියැදුරු ජීවිතක්ෂයට - කාර්තිව් පොලිස් වසම.

2026.03.07 දින සවස කාර්තිව් පොලිස් වසමේ සමන්තුර ප්‍රදේශයේ අතුරු මාර්ගයකදී ටේලරයක් සහිත ට්‍රැක්ටර් රථයක් පටවන ලද ගොයම් කපන යන්ත්‍රයක් සමඟ ප්‍රධාන මාර්ගය දෙසට ධාවනය වෙමින් තිබියදී රියැදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන රියැදුරු රථයෙන් බිමට ඇද වැටී එම රථයටම යට වී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ රියැදුරු එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 40 ක් වූ අම්පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කාර්තිව් පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**